ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## <u>පුවත්පත් නිවේදනය</u>

## <u>වොයිස් ඔෆ් ග්ලෝබල් සමුළුව</u>

නවමු සහ සුවිශේෂී ක්‍රියාමාර්ගයක් ලෙස ඉන්දියාව "වොයිස් ඔෆ් ග්ලෝබල් සවුත්" (Voice of Global South) නමින් විශේෂ අතථ්‍ය සමුළුවක් 2023 ජනවාරි 12-13 දිනවල සංවිධානය කර ඇත. "හඬෙහි එක්සත් බව, අරමුණෙහි එක්සත් බව" යන තේමාව යටතේ පැවැත්වෙන මෙම සමුළුව ගෝලීය දකුණේ රටවල් එකට එක් කරමින් එම රටවල අදහස් සහ ප්‍රමුඛතාවයන් පොදු වේදිකාවකට ගෙන ඒමේ අරමුණින් පැවැත්වේ. රටවල් 120කට අධික ප්‍රමාණයක් මෙම සමුළුව සඳහා සහභාගී වීමට ආරාධනා ලබා ඇත.

2. මෙම සමුළුව අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ "සබ්කා සාත්, සබ්කා විකාස්, සබ්කා විශ්වාස් සහ සබ්කා ප්‍රයාස්" යන දැක්මෙන් ආභාසය ලබා ඇති අතර ඉන්දියාවේ වාසුධායිව කුටුම්භකම් යන දර්ශනයෙන් සවිමත් වී ඇත.

3. වොයිස් ඔෆ් ග්ලෝබල් සවුත් සමුළුවේ දී සහකාර රටවල් විසින් ඉදිරිපත් කරනු ලබන වටිනා අදහස් ගෝලීය වශයෙන් සැලකිල්ලට බඳුන් වන බව සහතික කිරීමට ඉන්දියාව කටයුතු කරනු ඇත.

4. එසේම, G20 සංවිධානයේ ඉන්දියාවේ වත්මන් සභාපතිත්වය G20 සංවිධානයේ සාමාජික නොවන රටවලට සිය අදහස් සහ G20 සංවිධානයෙන් අපේක්ෂා කරන දේ කවරේද යන්න බෙදා හදා ගැනීමට විශේෂ සහ ශක්තිමත් අවස්ථාවක් ලබා දේ. මෙය ඉන්දියාවේ G20 සභාපතිත්වය අපගේ G20 සහකරුවන්ගේ අදහස්වලින් පමණක් නොව බොහෝ විට නෑසී යන ගෝලීය දකුණේ වෙනත් රටවල අදහස් වලින් ද හැඩගැස්වෙනු ඇත යනුවෙන් අග්‍රාමාත්‍යතුමා පැවසු වදන්වලට සමපාත වේ.

5. වොයිස් ඔෆ් ග්ලෝබල් සවුත් සමුළුව සැසි දහයකින් සමන්විත වේ. ජනවාරි 12 වන දින සැසි 4ක් ද ජනවාරි 13 වන දින සැසි 6ක් ද පැවැත්වෙනු ඇත. මෙම එක් සමුළුවකට රටවල් 10-20ක නායකයන් සහ අමාත්‍යවරුන් සහභාගී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

6. සමාරම්භක සහ සමාප්ති සැසි අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය නායක/රජයේ මට්ටමින් පැවැත්වේ. සමාරම්භක නායක සමුළුව, “මනුෂ්‍ය කේන්ද්‍රීය සංවර්ධනය උදෙසා වොයිස් ඔෆ් ග්ලෝබල් සවුත්” යන තේමාව යටතේ ද සමාප්ති සැසිය “හඬෙහි එකසත් බව - අරමුණෙහි එක්සත් බව” යන තේමාව යටතේ ද පැවැත්වෙනු ඇත.

7. සමාරම්භක සහ සමාප්ති සැසි වලට අමතරව අමාත්‍ය සැසි 8ක් පැවැත්වේ. එම සැසි සහ තේමාවන් පහත දැක්වේ.

- “ජනතා කේන්ද්‍රීය සංවර්ධනය මූල්‍යනය කිරීම” යන තේමාව යටතේ මුදල් අමාත්‍යවරුන්ගේ සැසිය

- “පරිසර හිතකාමී ජීවන විලාසිතා (LiFE) සමඟ සංවර්ධනය සමබර කිරීම” යන තේමාව යටතේ පරිසර අමාත්‍යවරුන්ගේ සැසිය
- “ගෝලීය දකුණේ ප්‍රමුඛතා - හිතකර පරිසරයක් සහතික කිරීම” යන තේමාව යටතේ විදේශ අමාත්‍යවරුන්ගේ සැසිය
- “බලශක්ති සුරක්ෂිතතාවය සහ සංවර්ධනය - සෞභාග්‍යය සඳහා මාර්ග සිතියම” යන තේමාව යටතේ බලශක්ති අමාත්‍යවරුන්ගේ සැසිය
- “ප්‍රත්‍යාස්ථ සෞඛ්‍ය සේවා පද්ධතීන් ගොඩනැගීම සඳහා සහයෝගීතාවය” යන තේමාව යටතේ සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ සැසිය
- “මානව සම්පත් සංවර්ධනය සහ ධාරිතා සංවර්ධනය” යන තේමාව යටතේ අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ සැසිය
- “ගෝලීය දකුණ තුළ සහක්‍රියාවන් ගොඩනැගීම - වෙළඳාම, තාක්ෂණය, සංචාරක කර්මාන්තය සහ සම්පත්” යන තේමාව යටතේ වාණිජ සහ වෙළඳ අමාත්‍යවරුන්ගේ සැසිය
- “G20: ඉන්දියාවේ සභාපතිත්වය සඳහා යෝජනා” යන තේමාව යටතේ විදේශ අමාත්‍යවරුන්ගේ සැසිය

8. සමුළුව පිළිබඳ වැඩිදුර විස්තර ඉදිරියේ දී දැනුම් දෙනු ඇත.

(මෙහි අන්තර්ගතය විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2023 ජනවාරි 6 වන දින නිකුත් කරන ලද පුවත්පත් නිවේදනයක් ඇසුරින් සකස් කරන ලදී)

***

කොළඹ
2023 ජනවාරි 7